**සජිත් ප්‍රේමදාස (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**சஜித் பிரேமதாச (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கை பாராளுமன்றம்

**Sajith Premadasa (M.P.)**
Leader of the Opposition - Parliament of Sri Lanka

2023-09-03

**පාලකයන්ගේ අසමත්බාවය වසා ගැනීමට උසස් පෙළ සිසුන්ගේ අනාගතය බිලිදීම නවතා දමනු!**

2023 අධ්‍යයන වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගය පැවැත්වීමෙහිලා විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යංශය විසින් සිසුන්ගේ අයිතිවාසිකම් සහ ප්‍රායෝගික තත්වයන් නොසලකා හරිමින්, ඉතා අසාධාරණ ලෙස සිසු දරුවන්ගේ අනාගත ජීවිතයට ඉතා අහිතකර බලපෑම් එල්ලවන අයුරින් කෙසේ හෝ තම පරිපාලන කාලසටහන් සාර්ථක කරගැනීමේ මිලේච්ඡ අරමුණක නිරතව සිටින බව විපක්ෂ නායකවරයා ලෙස මෙන්ම, සුවහසක් වූ සිසුදරු-වන්ට යහපත් අනාගතයක් අපේක්ෂා කරන නායකයෙකු ලෙස මගේ අවධානය යොමු වී ඇත.

ආර්ථික අර්බුධය හමුවේ රට අස්ථාවර තත්වයන්ට මුහුණ දෙන යුගයක සිය ජීවිතයේ වැදගත්ම කඩයිම ආරම්භ-කිරීමට සිදුවීම එම දරු දැරියන්ගේ අවාසනාව නොව පාලක පක්ෂයේ අසමත්බාවය බව පාලකයන් සිහි තබාගත යුතුය. එම අසීරු තත්වයට රට ඇද දැමූ පාලකයන් නිසා එම දරුවන්ට සිය වැදගත්ම අධ්‍යයන වර්ෂයේ පාසල් යාමට තිබූ දින ගණන සීමාවීමේ පාඩුව එම දරුවන් පිට හෝ ගුරුවරුන් පිට පැටවීමට කිසිම සදාචාරාත්මක අයිතියක් ආණ්ඩුවට නොමැත. එම නිසා විෂය නිර්දේශය ආවරණය නොවී, නියමිත වාර විභාග 6න් 4ක් පමණක් පවත්වා ඇති පසුබිමක විභාගය නියමිත කාලයට කලින් පැවැත්වීම යනු සිසු දරුවන්ට සාධාරණ අවස්ථාවක් ලබාගැනීමට ඇති මානව හිමිකම අමු අමුවේ වළලා දැමීමක් ලෙස හැඳින්විය හැකිය. මේ හේතුවෙන් සිසුන් විශාල පිරිසක් දැඩි මානසික පීඩනයකට ලක් වී ඇත.

එසේම මෙවැනිම අන්ධකාර යුගයක සිය ජීවිත ගැටගසා ගැනීමේ දුෂ්කර අරගලයක නිරත වූ 2022 වසරේ උසස් පෙළ විභාගයට මුහුණ දුන් දරුවන්ටද මේ තුළින් සිදුවනුයේ බලවත් අසාධාරණයකි. මේ වන විටත් 2022 විභාග ප්‍රතිඵල නිකුත් නොකර ඇති පසුබිමක බලධාරීන් විසින් 2023 විභාගයට නියමිත දිනයට වඩා මාස පහකට අධික කාලයක් කපා දමා 2023 නොවැම්බර් මාසයට විභාග දින නියම කිරීම මගින් දෙවන වර විභාගයට සූදානම් වීමට එම දරුවන්ට ඉතුරු කරන්නේ මාස දෙකකටත් අඩු කාලසීමාවකි. එසේම විෂය වෙනස් කර විභාගයට පෙනී සිටින දරුවන්ට මෙය කිසිසේත් ප්‍රමාණවත් නොවන කාලයකි. ඒ සඳහා අවම මාස 6ක පමණ කාලයක්වත් ප්‍රතිඵල ලැබීමේ සිට ලබා දීම සාමාන්‍යයෙන් සිදු වූ ක්‍රමයයි. එසේම මේවන විටත් 2023 විභාගය සඳහා අයදුම්පත් කැඳවා අවසාන කර ඇති බැවින් 2022 ප්‍රතිඵල මත නැවත අයදුම් කිරීමට එම දරුවන්ට ඇති ඉඩකඩ අහුරා දමන බලධාරීන්ට සහාය දක්වමින් ඇමතිවරයා පවසන්නේ නැවත අයදුම්කිරීමට මීළඟ වසර දක්වා බලා සිටින ලෙසයි. මෙලෙස එම දරුවන්ගේ සරසවි සිහින බොඳකරලමින් කාලය කා දැමීම කිසිසේත් අනුමත කළ නොහැක.

මෙසේ තම ආණ්ඩුකරණයේ අසමත් අදූරදර්ශී ක්‍රියා පිළිවෙතේ විනාශකාරී ප්‍රතිඵල රටේ අනාගතය වන අහිංසක සිසු දරුදැරියන් පිට දමා ඔවුන්ගේ අනාගතය තවදුරටත් වළපල්ලට නොදමා, ප්‍රමාණවත් පරිදි කාලය ලබා දෙමින්, අධ්‍යාපනයේ ගුණාත්මකබාවය භුක්තිවිඳීමේ අයිතිය එම දරුවන්ට ලබා දෙමින් නියමිත කාල වකවානු, එනම් අධ්‍යාපන දෙපාර්තමේන්තුවම පිළිගෙන ඇති පරිදි විභාගය සඳහා වන වසර 2.5 ක අධ්‍යන කාලය එම දරුවන්ට ලබා දෙමින් විභාගය පැවැත්වීමට කටයුතු කරන ලෙස අධ්‍යාපන බලධාරීන්ට අවධාරණය කර සිටිමි.



සජිත් ප්‍රේමදාස
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක

දුරකතන : / தொலைபேசி : / Telephone : 011 2 777 253 / 011 2 699 171
ෆැක්ස් : / தொலைநகல் : / Fax : 011 2 699 174
විද්‍යුත් තැපෑල : / மின்னஞ்சல் : / Email : sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7
இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7
No 30, Sir Marcus Fernando Mawatha Colombo 7